# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2012/7 – 2017 මාර්තු 27 වැනි සඳුදා – 2017.03.27**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/10/39/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. ඒ. ඩී. සිරිපාල මයා, අංක 282/1, මාකොළ උතුර, මාකොළ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2017 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/10/39/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධන මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්*

එස්. ඒ. ඩී. සිරිපාල මයා, අංක 282/1, මාකොළ උතුර, මාකොළ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගොඩනැගිලි පරිපාලක වශයෙන් සේවය කළ එස්. ඒ. ඩී. සිරිපාල මහතාට 2011.11.03 දින පැවති විනය පරීක්ෂණය අනුව 2012.04.24 දිනැති විනය නියෝගය හා ඒ සඳහා කරනු ලැබූ අභියාචනයට අනුව 2012.11.22 දිනැති ලිපිය මගින් ලබා දුන් අභියාචනා නියෝගය ඉවත් කර වැඩ තහනම්ව සිටි කාලය වන 2011.08.23 දින සිට 2012.04.25 දින දක්වා කාලයට අදාළව මාස 08 යි දින 02 ක හිඟ වැටුප හා දින 07 ක වේතන දඩ සමග මාස 08 යි දින 09ක නොගෙවූ වැටුප ලබාදෙන ලෙසට ඔහු විසින් කරනු ලබන ඉල්ලීම සාධාරණ හා යුක්ති සහගත ද යන්න හා එලෙස සාධාරණ හා යුක්ති සහගත වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.'

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2017 පෙබරවාරි මස 08 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04 - 233

---

මගේ අංකය: IR/COM/01/P/2015/186.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ජී. කේ. සුදත් කුමාර මයා, උඩවෙල, අගලවත්ත.

2. එස්. වී. තුෂාරි ප්‍රියංගිකා මිය, "මදාරා", හොරහේන වෙන්දේසි වත්ත, මාපුටුගල, පෝරුවදණ්ඩ.

3. නයනා දර්ශනී රාජපක්ෂ මිය, වළාකුළුපොල, කුරුණෑගල.

4. සඳකැළුම් ප්‍රභා ද සිල්වා මයා, අංක 28/21, ජනසවි මාවත, සිද්ධමුල්ල, පිළියන්දල.

5. කේ. ඩබ්ලිව්. එම්. චන්දිමා ප්‍රියදර්ශනී මිය, අංක 11, එවර්ග්‍රීන් ගාර්ඩ්න්, කෝන්පොල පාර, දොරටියාව, කුරුණෑගල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

තුරුසවිය අරමුදල, අංක 55/75, වොක්ස්හෝල් පටුමග, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්ː පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30 හි සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2017 මාර්තු මස 09 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකයː IR/COM/01/P/2015/186.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ජී. කේ. සුදත් කුමාර මයා, උඩවෙල, අගලවත්ත.

2. එස්. වී. තුෂාරි ප්‍රියංගිකා මිය, "මදාරා", හොරහේන වෙන්දේසි වත්ත, මාපුටුගල, පෝරුවදණ්ඩ.

3. නයනා දර්ශනී රාජපක්ෂ මිය, වළාකුළුපොල, කුරුණෑගල.

4. සඳකැළුම් ප්‍රභා ද සිල්වා මයා, අංක 28/21, ජනසවි මාවත, සිද්ධමුල්ල, පිළියන්දල.

5. කේ. ඩබ්ලිව්. එම්. චන්දිමා ප්‍රියදර්ශනී මිය, නො. 11, එවර්ග්‍රීන් ගාර්ඩ්න්, කෝන්පොල පාර, දොරටියාව, කුරුණෑගල.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

තුරුසවිය අරමුදල, අංක 55/75, වොක්ස්හෝල් පටුමග, කොළඹ 02.

පහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''තුරුසවිය අරමුදල මගින් 2002 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම යටතේ සේවයට බඳවාගත් ජී. කේ. සුදත් කුමාර, එස්. වී. තුෂාරි ප්‍රියංගිකා, නයනා දර්ශනී රාජපක්ෂ, සඳකැලුම් ප්‍රභා ද සිල්වා, කේ. ඩබ්ලිව්. එම්. චන්දිමා ප්‍රියදර්ශනී යන සේවකයන් පස්දෙනා ඔවුන් කොන්ත්‍රාත් පදනම යටතේ සේවයට බඳවාගත් දින සිට හා /හෝ අදාළ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කළ දින සිට වැටුප් වර්ධක උපයා ගත්තා සේ සළකා වැටුප් තලවල පිහිටුවා ඔවුන්ගේ තනතුරු පෙරදාතම් කර ස්ථිර කිරීමෙන් පසුව එම වැටුප් පරිවර්තන වැරදි ලෙස සිදුකර ඇතැයි දක්වා වැඩිපුර ගෙවන ලද වැටුප් අඩුකර, වැටුප් ගෙවීමට තුරුසවිය අරමුදල කටයුතු කිරීම තුළින් ඔවුන්ට අසාධාරණයක් සිදුවූයේ යැයි එම සේවක පිරිස විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද යන්න සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඔවුන් එකිනෙකා වෙත වෙන වෙනම හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳ ව වේ.''

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2017 මාර්තු මස 02 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04 - 234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.